වක්‍රලේඛ අංක: 03/2019

RG/MBD/1/වක්‍රලේඛ


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: info@rgd.gov.lk, rg@rgd.gov.lk


# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகத் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE


වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.rgd.gov.lk, www.rgdept.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


2019.02. 20

දිනය / திகதி / Date: ..................................

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

## <u>1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (49) වන වගන්තියේ ප්‍රතිපාදන අදාළ කරගත හැකි අවස්ථා</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් හා බැඳේ.

පුද්ගලයින් විසින් සැලකිය යුතු කාලයක් භාවිත කර ඇතැයි නිරීක්ෂණය වන සහ එම අය භාරයේ තිබෙන උප්පැන්න සහතික, දෙපාර්තමේන්තු ලේඛනවලට ඇතුලත් නොවී ඇති අවස්ථා පිළිබඳ විවිධ මහජන පැමිණිලි/ ඉල්ලීම් වාර්තා වේ. විවිධ මානුෂීය, සමාජීය හෝ පෞද්ගලික හේතු මත පුද්ගලයින් විසින් දැනුවත්වම ව්‍යාජ සහතික භාවිත කර ඇති අවස්ථා ද නිරීක්ෂණය විය. තවද විශේෂයෙන් පාසල් ශිෂ්‍යයින් ජාතික හැඳුනුම්පත සකස් කර ගැනීමට යෑමේදී තමන් මෙතෙක් කල් භාවිත කර ඇති උප්පැන්නය නිසි පරිදි ලියාපදිංචි කරන ලද උප්පැන්නයක් නොවන බවට කරුණු අනාවරණය වන අවස්ථා ද වාර්තා විය.

උපතක් නිසි පරිදි ලියාපදිංචි නොවී ඇති අවස්ථාවකදී 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (24) වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර කල්ගත වූ උපතක් ලෙස උපත ලියාපදිංචි කර ගැනීමට ප්‍රතිපාදන ඇත. නමුත් දෙමාපියන් දෙදෙනාම හෝ එක් අයෙක් හෝ ජීවතුන් අතර සිටින නමුත් විවිධ හේතූන් මත දරුවාගේ උපන් දිනය, ස්ථානය සහ දෙමාපියන්ගේ තොරතුරු ලිඛිතව සනාථ කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී පනතේ (24) වන වගන්තිය යටතේ කටයුතු කරමින් උප්පැන්න සහතිකයක් නිකුත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ට කටයුතු කළ නොහැක.

උදා :-

- නිවසේ දී ඉපදුණු දරුවන් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී/ වින්නඹු මාතා නිකුත් කළ වාර්තාවෙහි මුල් ලේඛන විනාශවීම / පිටපත් නොමැතිවීම.

- රෝහල්වල ඉපදුණු දරුවන් සම්බන්ධයෙන් රෝහල් වාර්තා විනාශවීම  පිටපත් නොමැති වීම.